# 1977 ආර්ථික ක්‍රියාකාරිත්වය, ගැටළු හා ප්‍රතිපත්ති

## හැඳින්වීම

ඉකුත් පස් වසර තුළදී සාමාන්‍යයෙන් සියයට 3·5 ක වේගයකින් වැඩුණු ශ්‍රී ලංකා ආර්ථිකය 1977 දී එයට මඳක් වැඩි එහෙත්, මඳ පමණින් එනම්, සියයට 4·4 කින් දියුණු විය. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දේශීය ගොවිතැන, සේවා, වෙළෙඳ, ප්‍රවාහන හා පණිවුඩ හුවමාරු යන අංශයන්හි දක්නට ලැබූ දියුණුවකි. ඒ අතර, අපනයන මිල ආනයන මිල වැඩිවීම ඉක්මවා දියුණුවීම නිසා මෙරට වෙළෙඳ අනුපාතය[1] දෙවැනි වසරටත් කැපී පෙනෙන සේ දියුණු විය. එම නිසා මුළු අපනයන වලින් දහයෙන් පංගුවක පමණ වෙළෙඳ අතිරික්තයක් හෙවත් වාසියක්[2] ජනිත විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1965 න් පසු පළමු වරට, නැතිනම් 1956 න් පසු දෙවැනි වරට, ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයෙහි හෙවත් ගෙවුම් ශේෂයෙහි[3] ජංගම ගිණුම් අතිරික්තයක් හෙවත් වාසියක්[4] ඇතිවිය. මෙසේ ගෙවුම් තුලන තත්ත්වය සැහෙන අයුරින් ශක්තිමත් වීමේ හේතුවෙන් විදේශීය වත්කම් වල සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබිණි. මෙකී වර්ධනයන් නිසා දේශීය මුදල් සැපයුම මත දෙවැනි වසරටත් 1977 දී තියුණු ප්‍රසාරණාත්මක බලපෑමක් එල්ල වූයේය. එමනිසා, පෞද්ගලික හා රාජ්‍ය අංශයන්හි මුදල් ව්‍යාප්තිය සීමා කරන සුළු පියවර ගැනීමට සිදුවිය. එසේ වුවද, මුදල් සැපයුමේ අධික යයි සැලකිය හැකි ප්‍රසාරණයක් ඇතිවූ අතර, මිල මට්ටම් කෙරෙහි සැලකිය යුතු උද්ධමනකාරි පීඩනයක් ඇති කිරීමට මෙම තත්ත්වය ප්‍රධාන වශයෙන් හේතුවිය. වසර අවසානය හරියේදී මුදල් වැටුප් වැඩිවූ නමුදු, සමහර විට වැවිලි අංශයේ හැර, අනෙක් අංශයන්හි නියම හෙවත් මූර්ත වැටුප් අඩුවූ බව දක්නට ලැබිණි. මෑත වර්ෂවලදී වැඩිවන සේවා බලකාය ඇද ගැනීමට තරම් ප්‍රමාණවත් නොවන අයුරින් ආර්ථික-යෙහි වූ අල්ප වර්ධනය නිසා සේවා වියුක්තිය එන්ට එන්ටම වැඩිවන බව දක්නට ලැබිණි. මෙවැනි ආර්ථික තත්ත්වයකට මුහුණ දුන් නව රජය, ඊට පිළියම් වශයෙන් නව ප්‍රතිපත්ති රාශියක් ක්‍රියාත්මක කළේය. මෙම ආර්ථික ප්‍රතිපත්ති 1956 න් පසු, නැතිනම් සමහර විට 1948 දී ශ්‍රී ලංකාව නිදහස් රටක් බවට පත්විමෙන් පසු, නොයෙක් රජයයන් විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති වලට හාත්පසින් වෙනස් ස්වරූපයක් ගෙන ඇති බව පෙනේ. මේ අතින් බලන විට, 1977 වර්ෂය ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාසයෙහි සන්ධිස්ථානයක් වශයෙන් ගිණිය හැකිය.

1977 දී, දළ ජාතික නිෂ්පාදිතය (පවත්නා මිල අනුව)[6] සියයට 21 කින් ඉහළ නැංගේය. මෙයින් මිල වැඩිවීම් ඉවත් කළ විට නියම දළ ජාතික නිෂ්පාදිතයෙහි වර්ධනය සියයට 4·4 ක් විය. ජන සංඛ්‍යාවේ සියයට 1·7 ක වැඩිවීම සඳහා ඉඩ හළ විට, ඒක පුද්ගල නියම (මූර්ත)

---

1. වෙළෙඳ අනුපාතය යනු අපනයන මිල ආනයන මිලෙහි ශතකයක් ලෙස ගණන් බැලීමකි.

   එය ගණිනු ලබන්නේ මෙසේය: $\frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$,

2. වෙළෙඳ අතිරික්තය යනු වෙළෙඳ තුලනය හෙවත් ශේෂයෙහි වාසියකි. වෙළෙඳ තුලනය හෙවත් ශේෂය යනු එක් වසරෙක භාණ්ඩ අපනයන සහ ආනයන වටිනාකම සැසඳීමයි.
3. ගෙවුම් තුලනය හෙවත් ශේෂය යනු එක් වසරෙක රටක් විසින් භාණ්ඩ, සේවා සහ ප්‍රාග්ධන සඳහා කෙරෙන සියලුම ගෙවීම් සහ ලැබීම් සැසඳීමයි.
4. ගෙවුම් තුලනය හෙවත් ශේෂය කොටස් දෙකකින් හෙවත් ගිණුම් දෙකකින් සමන්විත වේ. වර්තන ගිණුමට ගැනෙනුයේ භාණ්ඩ සහ සේවා සඳහා කැරෙන ගෙවීම් සහ ලැබීම් ය. ප්‍රාග්ධන ගිණුමට ප්‍රාග්ධන ගෙවීම් සහ ලැබීම් අඩංගු වේ.
5. මහජනයා වෙතැති මුදල් ප්‍රමාණය වැඩිවීම ප්‍රසාරණාත්මක බලපෑමයි. එම මුදල් අඩු වූ විට සංකෝච-නාත්මක බලපෑමක් ඇති වේ.
6. යම් රටක එක් වසරක් තුල නිපදවුනු භාණ්ඩ සහ සේවා ප්‍රමාණය එකල පවතින මිල අනුව මැනීමෙන් ''පවත්නා මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය'' ගණන් බැලිය හැකිය. නමුත් මෙයට මිල මට්ටමේ වැඩිවීමත් අඩංගු වන නිසා, නියම හෙවත් ''මූර්ත දළ ජාතික නිෂ්පාදිතය'' සෙවීම සඳහා මිලෙහි වැඩිවීම ඉන් ඉවත් කළ යුතුය. එසේ කළ විට; ''ස්ථාවර මිල (1959) අනුව දළ ජාතික නිෂ්පාදිතය'' ලබා ගත හැකිය. එයින් හැඳින්වෙන්නේ වසරෙක භාණ්ඩ හා සේවා නිපදවීම 1959 පැවති මිල අනුව අගැයීමකි.

නිෂ්පාදිතය සියයට 2·6 කින් ඉහළ ගියේය. මෙය ඉකුත් දෙවසර තුළ සිදුවූ වර්ධනය මෙන් දෙගුණයකි. අනෙක් අතට, දේශීය ඉතුරුම් දේශීය නිෂ්පාදිතයෙන් සියයට 14 සිට සියයට 19 දක්වා වැඩිවූ අතර, ස්ථිර ප්‍රාග්ධන සම්පාදනය ඉකුත් වසරේදී වූ සියයට 24 වර්ධනය හා සසඳන විට සියයට 10 ක්න් ඉහළ නැංගේය. රජයේ ප්‍රාග්ධන සම්පාදනයේ පසුබැස්මක් නිසා 1977 ප්‍රාග්ධන සම්පාදන වේගය දුර්වල වූ බව පෙනේ.

1977 දී මූර්ත ජාතික නිෂ්පාදිතයෙහි වූ වැඩිවීමෙන් අඩක්ම ඇති වූයේ කෘෂිකාර්මික අංශයෙහිය. ආර්ථිකයෙහි මෙම අංශයට හිමිවන ප්‍රමුඛස්ථානය මෙමගින් පිළිබිඹු වෙයි. මෑත අතීතයෙහි දක්නට ලැබුණු අල්ප වර්ධනයට බොහෝ දුරට වගකිව යුතු වූයේ ද මෙම අංශයෙහි අසමබර ක්‍රියාකාරිත්වයයි. එයට ප්‍රධාන හේතුව වශයෙන් අයහපත් කාලගුණය පෙන්වා දිය හැකිය. මේ අනුව, මෙරට ආර්ථිකය කාලගුණික වෙනස්වීම් මත අධික ලෙස රඳා පැවතීම, රටේ සංවර්ධන ප්‍රයත්නය කෙරෙහි විශාල බාධකයක්ව පවතී. රටේ ආර්ථික සංවර්ධනයෙහිලා ජලය පිරිමැස්මෙන් භාවිතය කිරීම, ජල සංරක්ෂණය හා වාරිමාර්ග ක්‍රමයන් සඳහා කෙරෙන ආයෝජනයන්හි වැදගත්කම මෙයින් කැපී පෙනෙයි.

1977 දී මෙරට වී නිෂ්පාදනය සියයට 34 කින් බුසල් දශ ලක්‍ෂ 80·4 ක වාර්තාගත මට්ටමකට වැඩිවී ඇතැයි ගණන් බලා ඇත. මහ කන්නයේ අස්වැන්න වූ බුසල් දශ ලක්ෂ 54·8 හා යල කන්නයේ වූ බුසල් දශ ලක්‍ෂ 25·6 නව වාර්තා පිහිටුවා ඇත. තේ නිෂ්පාදනය සියයට 7 කින් ඉහළ ගිය අතර, රබර් නිෂ්පාදනය සුළු ප්‍රමාණයකින් පහළ වැටිණි. පොල් නිෂ්පාදනය තියුණු ලෙස අඩු විය. වී හා තේ නිෂ්පාදනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කාලගුණය යහපත් වීම සහ මිල නැගීම නිසා නිෂ්පාදකයන් දිරි ගැන්වීමයි. මේ අතර, පොල් නිෂ්පාදනය අඩුවූයේ ඉකුත් වසරේ පැවති නියගයේ විපාක වශයෙනි. 1977 දී අතිරේක ආහාර භෝග රාශියකම නිෂ්පාදන මට්ටම් දියුණු විය. එහෙත්, අල වර්ග නිෂ්පාදනය පහත වැටිණි. ආදේශන ආහාරයක් වශයෙන් තිරිඟු පිටි සුලභව ලබා ගත හැකිවීම මෙම තත්ත්වයට හේතු වූවා විය හැකිය.

තේ, රබර් හා පොල් යන ප්‍රධාන අපනයන වර්ගත්‍රය කෙරෙහි යැපීම අඩු කිරීමේ අටියෙන් අපනයන රටාව විවිධාංගකරණය කිරීම අවුරුදු ගණනාවක සිටම රජයේ ප්‍රතිපත්තියේ ප්‍රධාන අංගයක් විය. විවිහිය ක්‍රමයේ ස්වරූපයෙන් වැඩි වාසිදායක ද්විත්ව විනිමය අනුපාතිකයක් තිබීමත්, පරිවර්තන්‍ය රුපියල් ගිණුම් ක්‍රමයේ ස්වරූපයෙන් අතිරේක පෙළඹවීම් තිබීමත්, මෑත වර්ෂවලදී සුළු ගොවි අපනයන, මැණික් හා සුළු කාර්මික අපනයන මාර්ගයෙන් වූ අපනයන ඉපැයීම් වැඩිවීමට හේතු වී ඇත. රේගු වාර්තා වලට අනුව, 1977 දී මෙම අපනයන සියයට 18 කින් පමණ තවදුරටත් දියුණු වී ඇත. සුළු ගොවි අපනයන වලින් ආදායම සියයට 46 කින් වැඩිවූ අතර, කාර්මික අපනයන සියයට 11 කින් පමණ ඉහළ ගියේය. මැණික් අපනයන සියයට 7 කින් වැඩිවූ බව රේගුව වාර්තා කළ නමුදු, ප්‍රධාන වශයෙන් වෙළෙඳ පොළේ අවිනිශ්චිත තත්ත්වයන් හේතු කොට ගෙන, අපනයන වටිනාකම සියයට 11 කින් පහත වැටුණු බව රාජ්‍ය මැණික් සංස්ථාව වාර්තා කළේය. 1976 දී මෙකී අප්‍රධාන අපනයනයන්, මුළු අපනයන ඉපැයීම් වලින් සියයට 26 කට වග කිවූ අතර, 1977 දී එය සියයට 22 දක්වා පහත වැටිණි. මෙයින් පිළිබිඹු වන්නේ 1977 දී තේ අපනයන ආදායමේ විශාල වැඩීම මිස, අපනයන විවිධාංගකරණ ව්‍යායාමයේ පසු බැස්මක් නොවේ. සංචාරක ව්‍යාපාරයේ දළ ඉපැයීම් 1976 දී රුපියල් දශලක්‍ෂ 198 ක් වූ අතර, 1977 දී රුපියල් දශලක්‍ෂ 267 දක්වා ඉහළ ගියේය.

1977 දී ද කාර්මික අංශයෙහි එතරම් දියුණුවක් දක්නට නො ලැබුණි මෑත කාලයේදී ආයෝජනය හා අමුද්‍රව්‍ය ගෙන්වීම් සම්බන්ධයෙන්, රාජ්‍ය අංශය කෙරෙහි දැඩි නැම්මක් පැවතුනි. එහෙත්, මෙම අංශයේ ඵලදායිතාවය බලාපොරොත්තු සපුරාලීමට නොහැකි විය. මෙම තත්ත්වයට හේතු වූයේ රාජ්‍ය අංශයේ ඒකාධිකාරී බලය, දිරි ගැන්වීම් නොමැති-වීම, කළමණාකාරී ප්‍රවීනත්වය ප්‍රමාණවත් නොවීම සහ නිෂ්පාදනය, මිල හා සේවකයන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තීන් කෙරෙහි අධික ලෙස ඇහිලි ගැසීම යන කරුණු බව පෙනේ

මෙම අංශය කාර්යක්‍ෂම කිරීමට නම් මෙකී ගැටළු නිරාකරණය කර ගත යුතුව තිබේ. පාඩු ලබන සංස්ථා වසා දමන බවත්, ප්‍රධාන කාර්මික ව්‍යාපාර සමහරක් පෞද්ගලික අංශයේ කළමණාකරණයට භාර දෙන බවත්, 1977 අවසන් හරියේදී රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. රාජ්‍ය අංශයේ ව්‍යාපාර බොහොමයක්ම තමන් මත පටවන ලද (ප්‍රාදේශීය සංවර්ධනය, ජීවන වියදම වැඩි නොවෙන්නට මිල සීමා කිරීම වැනි) සමාජමය වගකීම් හේතු කොට ගෙන මූල්‍යමය පාඩු විඳිති. එවැනි අවස්ථාවන්හිදී මූල්‍යමය ලාභ ලැබීම පමණක් කාර්යක්‍ෂමතාවය පිළිබිඹු කරන්නක් නොවනු ඇත. අනෙක් අතට, පෞද්ගලික අංශයේ කර්මාන්ත වලට ද අමුද්‍රව්‍ය හා යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීම සම්බන්ධයෙන් නිළතන්ත්‍රවාදී පාලනය නමැති සඳතනික බාධකයට මුහුණ පෑමට සිදුවිය. කෙසේ වුවද, මෙකී භාණ්ඩ ගලා ඒම 1977 දී තරමක් හොඳ අතට හැරිණි. ධාරිතා හෙවත් නිෂ්පාදන හැකියා උපයෝගීකරණය දියුණු වූවද, එය තවදුරටත් පහත් මට්ටමක පැවතිණි. මෙකී කර්මාන්ත ඇතැම් විටෙක සෑහෙන ඒකාධිකාරී බලතල ද සහිතව කාලයක් තිස්සේ විදේශීය ආනයනයන් ගෙන් දැඩි ලෙස ආරක්‍ෂා කරනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒවා උදාසීන සහ පෙරට නොයන සුළු තත්ත්වයට පත්ව ඇත. කර්මාන්ත අංශය ඉහතකී පාලන යදමින් මුද හැරීමේ අරමුණෙන්, 1977 නොවැම්බර් මාසයේදී, රජය, අමුද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ ආනයනය නිදහස් කරන ලදී.

1977 දී ශ්‍රී ලංකාවේ වෙළෙඳ හා ගෙවීම් තත්ත්වය සෑහෙන දියුණුවක් පෙන්වීය. මෙයට ප්‍රධාන හේතුව වූයේ වෙළෙඳ අනුපාතය පිට පිටම දෙවැනි වසරටත් කැපී පෙනෙන අයුරින් දියුණු වීමයි. 1965 සිටම දිගින් දිගටම පිරිහෙමින් පැවති ශ්‍රී ලංකාවේ වෙළෙඳ අනුපාතය 1976 දී සියයට 35 ක නැගීමක් පෙන්වූ අතර, 1977 දී තවදුරටත් සියයට 31 කින් ඉහළ ගියේය. වෙළෙඳ දර්ශකයනට අනුව, අපනයන පරිමාව සියයට 8 කින් පහළ වැටුණද, අපනයන මිල මට්ටම සියයට 60 කින් වර්ධනය විය. අනෙක් අතට ආනයන මිල සියයට 23 කින් ද, ආනයන පරිමාව සියයට 29 කින්ද ඉහළ ගියේය. තේ අපනයන මිලෙහි සියයට 80 ක පමණ පෙර නොවූ විරූ අන්දමේ දියුණුවක් දක්නට ලැබුණි. මීට හේතු වූයේ ලෝක තේ මිලෙහි අඛණ්ඩ දියුණුවීමත්, 1977 අවසාන භාගයෙහි රුපියලෙහි අගය අඩුවීමත්ය. මෙකී වර්ධනයන් හේතු කොට ගෙන ඉකුත් වර්ෂයේදී වූ රුපියල් දශලක්‍ෂ 170 ක වෙළෙඳ අතිරික්තය හා සසඳන විට, 1977 දී රුපියල් දශලක්‍ෂ 631 ක වෙළෙඳ අතිරික්තයක් ඇතිවූ බව රේගු වාර්තාවලින් පෙනේ. එසේ වුවද, තථ්‍ය ගෙවීම් දත්තයනට අනුව, 1977 සඳහා දක්වෙන වෙළෙඳ අතිරික්තය රුපියල් දශලක්‍ෂ 490 ක් වෙයි. පසුගිය වර්ෂයේදී සේවාවන්ගෙන් (අදිසි) වූ ශුද්ධ ලැබීම් දෙගුණවීමත්, කලින් වර්ෂයේ ප්‍රමාණයටම වූ ශුද්ධ සංක්‍රාම ගෙවීම් ප්‍රමාණයත් සැලකිල්ලට ගත් කල්හි, ඉකුත් වර්ෂයේදී ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ රුපියල් දශලක්‍ෂ 50 ක හිඟය 1977 දී පෙර නොවූ විරූ පරිදි රුපියල් දශලක්‍ෂ 1,259 ක අතිරික්තයක් බවට පෙරළී ඇතිබව පෙනී යයි. තවද, රුපියල් දශලක්‍ෂ 754 ක දිගුකාලීන ප්‍රාග්ධන (ශුද්ධ) ලැබීම් නිසා, 1976 දී රුපියල් දශලක්‍ෂ 665 ක් වූ මූලික තුලනය හෙවත් ශේෂය[7] මෙම වර්ෂයේදී රුපියල් දශලක්‍ෂ 2,013 දක්වා ඉහළ ගියේය. ගෙවුම් තුලනයෙහි මෙසේ ඇති වූ ප්‍රබල දියුණුවේ අවසාන ප්‍රතිඵලය වූයේ ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම් රුපියල් දශලක්‍ෂ 4,171 කින් වැඩිවීමයි. එසේ වුවද, ශ්‍රී ලංකා රුපියලේ සහ අනෙකුත් අදාළ ජාත්‍යන්තර මුදල් වර්ගවල විනිමය අනුපාතික වෙනස්වීම නිසාත් එම විදේශීය වත්කම් නැවත අගැයීම නිසාත්, විදේශීය වත්කම්හි සැලකියයුතු ප්‍රමාණයක වැඩීමක් සිදුවුනු බව පෙනුනී.

ශ්‍රී ලංකාවේ ගෙවුම් තත්ත්වයෙහි වූ දියුණුව, විදේශීය බැංකු වත්කම්හි සීඝ්‍ර දියුණුවකට තුඩු දුන් අතර, එමගින් 1977 දී රුපියල් දශ ලක්‍ෂ 1,200 ක හෙවත් සියයට 29 ක තියුණු දේශීය මූල්‍ය ප්‍රසාරණයක් ඇති විය. මෙය සිදු වූයේ ඉකුත් වසරේ වූ සියයට 35 ක මුදල් සැපයුම වැඩිවීමට අනතුරුවය. මෙකී වර්ධනයන් නිසා, සමස්ත ණය සීමා කිරීමක් අරභයා

---

7. මූලික තුලනය හෙවත් ශේෂය යනු ගෙවුම් තුලනයේ ජංගම ගිණුමට ශුද්ධ දිගු කාලීන ප්‍රාග්ධන ලැබීම් එකතු කළ විට ලැබෙන ප්‍රතිඵලයයි. එයින් රටෙක විදේශ ගනුදෙනු ශක්තිය හෝ දුර්වලතාවය විදහා දක්වෙයි.

මහ බැංකු ණයදීම් සීමා කිරීමද, බැංකු පොළිය[8] වැඩි කිරීමද, රට තුළ කෙටි කාලීන ණය සඳහා අයකරනු ලබන පොළී ප්‍රමාණයන් තියුණු ලෙස වැඩි කිරීමද අවශ්‍ය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මහජනයා විසින් කරනු ලබන කාලීන හා ඉතිරිකිරීම් තැන්පතුවල සැලකියයුතු වැඩිවීමක් හටගත් අතර, එමගින් මුදල් සැපයුම මත පෞද්ගලික අංශයේ සංකෝචනාත්මක බලපෑමක් සිදු කෙරිණි. රාජ්‍ය අංශයෙහි ද සංකෝචනාත්මක බලපෑමක් ඇති කෙරිණි. මේ අනුව, වර්ෂය තුල අනුගමනය කරන ලද මූල්‍ය ප්‍රතිපත්තීන් නොවන්නට, ආර්ථිකය කෙරෙහි වූ උද්ධමනය තවත් උග්‍ර වනු නිසැකය.

1977 වර්ෂය තුලදී ශ්‍රී ලංකාවේ විනිමය ක්‍රමයෙහි මූලික වෙනසක් සිදුවිය. වර්ෂය ආරම්භ කරනු ලැබුයේ ශ්‍රී ලංකාව සමග වැඩියෙන් ගනුදෙනු කරන රටවල ජාත්‍යන්තර මුදල් සමූහයකට රුපියල ඈඳීමෙනි. ගෙවීම් තත්ත්වයෙහි ඇති වූ දියුණුවට හේතුව ආර්ථිකයෙහි සිදු වූ කිසියම් ව්‍යුහාත්මක ශක්තියක් බවට පැහැදිලි සාක්ෂි නොමැති වුවද, මාර්තු 12 වැනි දින රජය විසින් ශ්‍රී ලංකා රුපියල සියයට 20 කට ආසන්න ප්‍රමාණයකින් ප්‍රති අගය කරන ලදී. එම නිසා අමෙරිකා එක්සත් ජනපද ඩොලරයක වටිනාකම රුපියල් 8.72 සිට රුපියල් 7.28 ක ප්‍රමාණයට පත් කරන ලදී. අගෝස්තු මාසයේදී මෙම තත්ත්වය නිවැරදි කිරීමට තීරණය කළ රජය, රුපියලේ විදේශ අගය ක්‍රම ක්‍රමයෙන් පහළ වැටීමට ඉඩ හැරියේය. පසුව, නොවැම්බර් 15 වැනි දින අංග සම්පූර්ණ විනිමය අනුපාතික ප්‍රතිසංස්කරණයක් ක්‍රියාත්මක කරන ලදී. මූලික අනුපාතිකය සහ අධිමිල (වි.වි.හි.ස.) අනුපාතිකය මුලදී එක්සත් ජනපද ඩොලරයක් රුපියල් 16.00 වන සේ ඒකාබද්ධ කොට, රුපියලේ විදේශීය අගය පාවීමට සලස්වන ලදී. ආරම්භයේදී එක්සත් ජනපද ඩොලරයක මිලදී ගැනීමේ හා විකිණීමේ අනුපාතිකයන් රුපියල් 15.97 ක් සහ රුපියල් 16.03 ක් විය. වර්ෂය අවසානය වන විට මෙම ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් 15.33 ක් සහ රුපියල් 15.59 ක් විය.

මේ ප්‍රතිසංස්කරණය සමගම අංග සම්පූර්ණ ආනයන ලිහිල් කිරීමක් ද ක්‍රියාත්මක කරන ලදී. මේ අනුව භාණ්ඩ කීපයක් හැර, අනෙක් භාණ්ඩ රාශියක් නිදහසේ ආනයනය කිරීමට ඉඩ දෙන ලදී. රටේ ආරක්ෂාව, දේශීය කර්මාන්ත ආරක්‍ෂා කිරීම, රජයේ සහනාධාර අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය, සහ දේශපාලනමය කරුණු හේතුකොටගෙන තවදුරටත් ආනයන බලපත්‍ර ලබාගතයුතු භාණ්ඩ පමණක් මෙම ආනයන ලිහිල් කිරීමට අඩංගු නොකරන ලදී. තවද, ආනයන තරඟකාරිත්වයකට ඉඩ දෙනු ලබන අතර, දේශීය ව්‍යවසායයන් ආරක්‍ෂා කරවීමේ ද අටියෙන් සකස් කරනු ලැබූ නව බදු ක්‍රමයක් ඒ හා සමගම ක්‍රියාත්මක කරන ලදී. රුපියල් 7,00,000 දක්වා ප්‍රාග්ධන භාණ්ඩ නිදහසේ ආනයනය කිරීමට ඉඩහරින ලදී. වෙනත් ආකාරයකින් කියතොත්, දැඩි ප්‍රමාණාත්මක පාලනයන්ගෙන් ඉවත්වී තීරු බදු මගින් පාලිත සරල ආනයන ක්‍රමයක් කරා යන රාජ්‍ය ප්‍රතිපත්තිමය මූලික වෙනස්වීමක් සිදුවී ඇත.

තවද, විදේශීය ගෙවීම් සම්බන්ධයෙන් පැවති දැඩි පාලනය ලිහිල් කිරීමක්ද, රාජ්‍ය ඒකාධිකාරී බලයෙහි යම් ලිහිල් කිරීමක් ද සිදුවිය. රජයේ නොයෙකුත් වෙළෙඳ ඒකාධිකාරයන් ක්‍රම ක්‍රමයෙන් බැහැර කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි තරගකාරී වාතාවරණයක් ඇති කිරීමටත්, ක්‍රියා කරන ලදී. පාරිභෝගිකයන් වෙත දෙනු ලබන රාජ්‍ය සහනාධාර අඩු කිරීමට තීරණය වුනි. මෙහි මූලික පියවරක් වශයෙන් මසකට රුපියල් 300 කට වැඩි ආදායම් ලබන්නන්ට දෙනු ලබන ආහාර සහනාධාරය ඉවත් කර ගන්නා ලදී.

---

8. ''බැංකු පොළිය'' යනුවෙන් මෙහි හැඳින්වෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනෙකුත් වාණිජ බැංකුවලට දෙන ණයෙහි පොළී ප්‍රමාණයයි. බැංකු පොළිය වැඩි කළ විට, රටේ අනෙකුත් පොළී ප්‍රමාණයන්හි වැඩිවීමක් සිදු වෙයි.

මේ වනාහී මෙතෙක් මෙරට ක්‍රියාත්මක කරන ලද ප්‍රබලතම ආර්ථික ප්‍රතිසංස්කරණයන් කිහිපයකි. ජන සංඛ්‍යා වර්ධනය සීමා කිරීමෙන්, ආදයම් වඩාත් සමසේ බෙදීයාමට යැලැස්වීමෙන් සහ වැඩි ඒක පුද්ගල ආදයම් සහිත වෙනත් බොහෝ රටවල දක්නට නොමැති අන්දමේ ජීවන තත්ත්වයන් පවත්වාගෙන යාමෙන් අතීතයේදී ශ්‍රී ලංකාව සාර්ථක ප්‍රතිඵල ලබා ඇතිවාට කිසිදු සැකයක් නොමැත. මෙකී සමාජයීය ජයග්‍රහනයන් තිබියදීත්, ආර්ථිකයේ අල්ප දියුණුව හේතුකොටගෙන එකී ජීවන තත්ත්වයන් තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යාමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව දැඩි අන්දමින් හීන වී ඇත. මෙම ප්‍රශ්නයට තුඩු දුන් ප්‍රධාන හේතූන් මෙසේ රජය නිශ්චය කළේය. පාරිභෝජනය සඳහා දිගින් දිගටම සම්පත් විශාල ප්‍රමාණයක් වෙන් කිරීම ආර්ථික සංවර්ධනයට හා රැකීරක්ෂා ජනිත කිරීමට අහිතකර විය; වර්ෂ ගණනාවක් තිස්සේ වැඩෙමින් පැවති දැඩි පාලන තන්ත්‍රය මෙරට සාපේක්ෂ මිළ ගණන් තියුණු අන්දමින් විකෘති කොට පෞද්ගලික අංශය අධෛර්යමත් කොට තිබිණි; මෙම අඩුපාඩුව සපුරාලන අටියෙන් ගොඩනංවන ලද රාජ්‍ය අංශය නාස්තිකාර හා අලස බවට පත්වී තිබුණි; පිළිවෙලින් පැමිණි රජයයන්ට මේවා නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගැනීමට නොහැකි විය; ඒ වෙනුවට කෙටි කාලීන තාවකාලික පිළියම් යෙදීම නිසා ප්‍රශ්න තව තවත් උග්‍ර විය. මේ ආකාර ආර්ථික විනිශ්චයක් තුලින් නව ආර්ථික ප්‍රතිපත්තිය බිහිවී ඇත. මේ අනුව නිගමනය වනුයේ රටේ සම්පත් වලින් වැඩි කොටසක් ආදයම් සහ රැකියා වඩන ආයෝජනය කෙරෙහි යෙදවිය යුතු බවයි; රුපියලේ අගය අස්වාභාවික ලෙස වැඩියෙන් පවත්වාගෙන යාමේ මූලික චේතනාවෙන් ඇරඹුනු විදේශීය වෙළඳම සහ ගනුදෙනු පාලනය ඉවත් කළයුතු බවයි; පෞද්ගලික අංශය අධෛර්යමත් කිරීම අහෝසි කළයුතු බවයි; රාජ්‍ය අංශය වඩාත් කාර්යක්ෂම කළයුතු බවයි; එකී මූලික ප්‍රතිපත්ති මාලාවෙහි ප්‍රාථමික අරමුණ වූයේ, ආයෝජනය සඳහා වඩා වැඩියෙන් සම්පත් යෙදවීමත්, දරදඬු පාලනයන්ගෙන් ආර්ථිකය මුදවා ගැනීමෙන් ආර්ථික ව්‍යුහයෙහි සම්පත් ආයෝජනය හෙවත් යෙදවීම වෙළඳපලේ න්‍යායයන් අනුව සිදුවීමට අවකාශ ලබාදීමත්ය.

මෙම ප්‍රතිපත්තීන්හි සාර්ථකත්වය විශේෂයෙන් රඳා පවතිනුයේ, සමාජයීය හා දේශපාලනමය අවහිරතාවන් අභිබවා, එම ප්‍රතිපත්තීන් යථාර්ථ අවසානය දක්වා ක්‍රියාත්මක කරවන්නා වූ ආකාරය හා බලාපොරොත්තු වන නිෂ්පාදන ආදයම් හා රැකීරක්ෂා වැඩීම සඵල වන වේගය මතය. කෙටිකාලීන වශයෙන් සලකන කල්හි, විශේෂයෙන්ම සැලකියයුතු විදේශීය සම්පත් පරතරයක් ඇතිවුවහොත්, මිනිසුන්ගේ ජීවන තත්ත්වය කෙරෙහි ඇතිවිය හැකි අහිතකර බලපෑම සමහන් කිරීම පිණිස විදේශාධාර ලබාගැනීමට සිදුවනවා ඇත. එසේම, ආර්ථිකය නිදහස් කිරීමේ ප්‍රතිපත්තිය නිශාම අන්දමින් ක්‍රියාත්මක වීමට කාලයක් ගතවනු ඇත. උදහරණයක් වශයෙන්, එකී නිදහස් කිරීමට අනතුරුව ආනයනයන්හි තරමක උදසීන භාවයක් දක්නට ලැබේ. එහෙත්, දිගු කාලයක් තිස්සේ තිබූ දැඩි පාලනය හේතුකොට ගෙන, සිය වෙළඳ සබඳකම් නැවත පිහිටුවා ගැනීමටත්, වෙළෙඳපොල ගැන සොයා බැලීමටත්, ආනයන කරුවනට සිදුවන බැවින්, එවැන්නක් සිදුවීම බලාපොරොත්තු විය යුත්තකි. එපමණක් නොව, දැඩි පාලන තන්ත්‍රය ලිහිල් කිරීමද ක්‍රමානුකූලව කළයුතුය. රජය විසින් මෑතකදී ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණයන් බලාපොරොත්තු වන යථාර්ථ අවසානය දක්වා ගෙනයාමට නම්, මෙකී නව ආර්ථික ප්‍රතිපත්තීන්හි ගැබ්වූ මූලික දර්ශනය කවරක්දැයි ඒවා ක්‍රියාත්මක කරන්නවුන් විසින් අවබෝධ කළයුතු බව වැදගත් කාරණයකි. එමගින් අනාගතයේදී ක්‍රියාත්මක කෙරෙන නොයෙකුත් රාජ්‍ය ප්‍රතිපත්තීන්හි අන්‍යොන්‍ය එකඟත්වය තහවුරු වනවා ඇත.

## ජාතික නිෂ්පාදිතය සහ ආදයම

වර්තන මිල ගණන් අනුව 1977 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතය රුපියල් දශ ලක්ෂ 29,122 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. මෙය 1976 වර්ෂය සමග සැසඳීමේදී සියයට20.9 ක වැඩිවීමකි. මිල වැඩිවීම්වලට ගැලපූ පසු, 1959 ස්ථාවර මිල ගණන් අනුව 1977 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතය, 1976 වර්ෂයේ වාර්තාගත සියයට 3.0 ක වර්ධනය හා සසඳන කල, සියයට 4.4 කින් වර්ධනය වී ඇත. 1977 වර්ෂයේ ආර්ථිකයේ ඉහල වර්ධන අනුපාතය මූලික වශයෙන් දේශීය කෘෂිකාර්මික නිමැවුමේ සහ සේවා අංශයේ වැඩිවීම් නිසා උද්ගත වූවකි.